# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## වාරිමාර්ග අමාත්‍යාංශය
## ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

IWWRMP

## භූ විද්‍යා උප දෙපාර්තමේන්තුවේ (වාරිමාර්ග දෙපාර්තමේන්තුව) යන්ත්‍රෝපකරණ සඳහා අමතර කොටස් ප්‍රසම්පාදනය සහ සැපයීම

## LK-MOMDE - 470526 - GO-RFB

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත, ලෝක බැංකුව (WB) – ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) වෙතින් ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ පිරිවැය අරභයා ණය මුදලක් ලැබී ඇති අතර, එම ණය ලැබීම්වලින් කොටසක් **"භූ විද්‍යා උප දෙපාර්තමේන්තුවේ යන්ත්‍රෝපකරණ සඳහා අමතර කොටස් ප්‍රසම්පාදනය හා සැපයීම"** සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ වන ගෙවීම් සඳහා යෙදවීමට අපේක්ෂා කෙරේ. කොන්ත්‍රාත් අංකය LK-MOMDE-470526-GO-RFB

2. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ (PPC) සභාපති විසින් **"භූ විද්‍යා උප දෙපාර්තමේන්තුවේ යන්ත්‍රෝපකරණ සඳහා අමතර කොටස් ප්‍රසම්පාදනය හා සැපයීම"** සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා, තැබූ ලංසු දැන් කැඳවනු ලැබේ.

3. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය මගින් ලංසුකරණය මෙහෙයවේ.

4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු,

   **ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
   **ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය,**
   **දුරකථන : 94 11 2691163**
   **ඊමේල් : iwwrmp@sltnet.lk**

   වෙතින් ලබාගත හැකි අතර, වැඩකරන දිනයන්හි 09.30 පැය සිට 15.00 පැය දක්වා කාලයේදී පහත සඳහන් ලිපිනයේදී ලංසු ලිපි ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

5. පූර්ව ලංසු රැස්වීමක් 2026 මාර්තු 19 වන දින පෙ.ව. 10.30 ට පහත සඳහන් ලිපිනයේදී පැවැත්වේ.

6. සුදුසුකම් අවශ්‍යතා අතරට පහත කරුණු ද ඇතුළත් වේ.

   (අ) ලංසුකරු ව්‍යාපාරයේ වසර 10 ට වැඩි කාලයක් නිරතව සිටිය යුතු අතර පසුගිය වසර පහ (05) තුළ අවම වශයෙන් සමාන ව්‍යාපෘති තුනක් (03) සම්පූර්ණ කොට තිබිය යුතුය.

   (ආ) සේවාලාභීන්ගේ විස්තර සහ නිමා කිරීම සම්බන්ධයෙන් සහතික කළ වාර්තා සහිත ලේඛන/ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

   (ඇ) විදේශීය/ රජයේ ආයතන සමග වැඩ කිරීමේ පළපුරුද්ද ඉදිරිපත් කළ යුතුය.

   (ඇ) 37.2 වගන්තියේ (ලංසුකරුවන් සඳහා උපදෙස්) අවශ්‍යතාවයන්ට, තාක්ෂණ කාර්ය මණ්ඩලයේ සහ අනෙකුත් සුදුසුකම් අනුකූල විය යුතුය.

7. නැවත නොගෙවන ගාස්තු ලං රු. 30,000.00 ක් ගෙවීමෙන් අනතුරුව පහත ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැක. ගෙවීම් මුදල් හෝ බැංකු අණකරයක් බැංකුකරුගේ චෙක් පතක් මගින් ගෙවිය යුතුය. ලංසු ලිපි ලේඛන සීඝ්‍ර දූත සේවාව හරහා හෝ අතින් යවනු ලැබේ.

8. ලංසු 2026 අප්‍රේල් 02 වෙනි දින 11.00 පැයට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2026 අප්‍රේල් 02 වෙනි දින 11.00 පැයට පහත සඳහන් ලිපිනයේදී එම අවස්ථාවට පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් ලංසු විවෘත කරනු ලැබේ. සියලුම ලංසු සමග ලංසු ලිපි ලිපිලේඛනයෙහි නිර්දේශ කර ඇති ආකාරයට රු. 2,445,000.00 ක වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය.

9. ඉහත යොමු කරන ලද ලිපිනය (ලිපිනයන්) වන්නේ;

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය,**
**2 වන මහල, මහවැලි කේන්ද්‍ර ගොඩනැගිල්ල,**
**අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.**
**දුරකථන : 94 11 2691163**
**ඊ මේල් : iwwrmp@sltnet.lk**